- **නිදහස් ස්ථානයක් වීම(අවම වශයෙන් පිටින් ඇතුලුවීම සඳහා එක් ඇතුල්වීමේ ස්ථානයක් තිබීම හෝ පොදු භාවිතය සඳහා වෙන් කර ඇති ස්ථානයක් නොවීම- විදිය, මිදුල, පඩිපෙළ, පිළ , උඩුමහළෙහි ඉස්තෝප්පුව, ආලින්දය යනාදිය – හෝ වෙනත් නිවාස හරහා ඇතුලුවීමට ස්ථානයක් නොවීම);**
- **වෙනත් ගොඩනැගිල්ලක පිහිටි ස්ථානයක් වීම (හෝ එය වෙනත්** ගොඩනැගිල්ලක් වීම **වීම).**

**වෙනත් වර්ගයේ වාසස්ථාන** යනුවෙන් සඳහන් වන්නේ පදිංචිවීම සඳහා නුසුදුසු ස්ථානයක් වීමය.(ජංගම ස්ථානයක්වීම, අස්ථාවර ස්ථානයක්වීම හෝ පෙර සූදානමක් රහිතව නිර්මාණයවූ ස්ථානයක්වීම), එක් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් පිරිසක් නැවති සිටීමේ ස්ථානයක් වශයෙන් හෝ මෙම සංගණනය කරන අවස්ථාවේදි තාවකාලිකව රැඳි සිටින ස්ථානයක් වීමය උදාහරණයක් ලෙස ට්‍රේලරයක්-කැරවෑනයක්, කූඩාරමක්, වාහනයකට සවිවූ ජංගම නිවසක්, මුඩුක්කුවක්,මඩුවක්, ගුහාවක්, ගරාජයක්, බිම් මට්ටමට පහලින් වූ කුටියක්, ස්ථාලයක් යනාදී...
**තානාපති කාර්යාලයේ හෝ කොන්සියුලර් කාර්යාලයේ නවාතැන්** යනුවෙන් සඳහන් වන්නේ වෙනත් විදේශිය රටකට අයත් මෙහි දේශ සිමා මායිමක පිහිටි ප්‍රදේශයකි.
**සමූහ වාසස්ථාන** යනුවෙන් සඳහන් වන්නේ විවිධ පුද්ගලයින් කණ්ඩායම් වශයෙන් පදිංචිව සිටින සහ/හෝ එක් පවුලක් හෝ පවුල් ගණනාවක් පදිංචිව සිටින ගොඩනැගිල්ලක්වීමය. මෙම ප්‍රවර්ගයට හෝටල්, රෝහල්, වයස් ගත පුද්ගලයින් පදිංචි මහලු නිවාස, පිලිගැනීමේ මධ්‍යස්ථාන සහ වෙනත් ආකාරයේ ගොඩනැගිලි අයත්වනු ඇත.(ආගමික, පිලියම් කරන, උදවි උපකාර කරන, අධ්‍යාපනික ස්ථානයන් යනාදිය)

– **අදාල පවුල තානාපති කාර්යාලයේ හෝ කොන්සියුලර් කාර්යාලයේ නවාතැන් ගනු ලබන්නේ නම් 3** වන කොටුවේ කතිරය යොදන්න
– **අදාල පවුල සමූහ වාසස්ථානයක පදිංචිව සිටිනවා නම්** 4 වන කොටුවේ කතිරය යොදන්න. **උදාහරණයක් වශයෙන් ගත් කල යම්කිසි පවුලක් හෝටලයක හෝ හෝටල් කාමරයක පදිංචිව සිටී නම් නැතහොත් තමා ජිවත් වන ස්ථානය නිවසක් නොවේ නම් එය සමූහ වාසස්ථාන ගොඩනැගිල්ලක පිහිටා ඇත්නම් යනුවෙනි(උදාහරණයක් වශයෙන් රෝහලක් බලා ගන්නා පුද්ගලයාගේ පවුල එම අදාල ගොඩනැගිල්ල පිහිටා ඇති ස්ථානයේ පදිංචව සිටී නම්).**

**ප්‍රශ්න අංක 1.2**
**වාසස්ථානයෙහි බිම් ප්‍රමාණය වර්ග මිටර වලින් (දශම ගණන් නොමැතිව සම්පූර්ණ ඉලක්කම් සඳහන් කරන්න) සඳහන් කරන්න. මින් සඳහන් වන්නේ බිත්ති හැර අදාල බිම් ප්‍රමාණය වන අතර(පයට පෑගෙන ප්‍රමාණය)බැල්කනි, ආලින්දය, සහ ඊට අදාල දෑ හැර(උදාහරණයක් වශයෙන් කන්තිනාව,උඩු මහලේ ඇති කාමර, ගැරාජය යනාදිය.)ඔබගේ වාසස්ථානය තට්ටු කිහිපයකින් සමන්විත නම් හෝ එහි වෙනම ඇතුලු වීමට කාමර ඇත්නම් ඒ සියල්ලද මේ සමග එකතු කල යුතුය.**

**ප්‍රශ්න අංක 1.3**
**මෙම වාසස්ථානයෙහි එක් පවුලක් පමණක් ජිවත්වනවා නම් අංක 1 ද, දෙදෙනෙකුට වැඩිය සිටී නම් හෝ පවුල් කිහිපයක් සිටී නම් අංක 2 ද, සටහන් කරන්න.** තවද **මින් තහවුරු කර සිටින්නේ නෑදෑ කෙනෙකු නොවන්නේ නම් හෝ නෑදෑ නොවන පවුල් කිහිපයක් පමණක් එකට ජිවත්වනවා නම් පමණය.**

**ප්‍රශ්න අංක 1.4**
**මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුතු වන්නේ** 1. 3 **යන ප්‍රශ්නයේ අංක 2 ට කතිර ගැසූ පුද්ගලයන් පමණි. මෙම අවස්ථාවේදි අදාල කොටසෙහි සෑම පවුලකම එකට ජිවත්වන පුද්ගලයන් ගැන සඳහන් ප්‍රශ්න අංකය සඳහන් කල යුතු අතර( තම පවුල හැර) අදාල පවුලේ** ගෘහමූලිකයාගේ **වාසගම සහ නම සහ ඔවුන් සමග ජිවත්වන අය ගැනද සඳහන් කල යුතුය. එම ප්‍රශ්න අංකය ඒකාර්ථයෙන්ම හදුනා ගන්නේ පවුලේ විස්තර සඳහන් සෑම පත්‍රිකාවකම පළවන පිටුවෙහි උඩ කොටසෙහි දකුණු කෙළවරේ අංක 13 කින් සමන්විතවීමය. යම් විදියකින් මෙම වාසස්ථානයෙහි පවුල් 4 කට වැඩිය ජිවත්වනවා නම්** 800-069701 **යන නොමිලේ භාවිතා කල හැකි දුරකථන අංකයට කතා කල යුතුය.**

**ප්‍රශ්න අංක 1.5**
**මෙහි ප්‍රශ්න අංක 1 ට කතිරය ගැසිය යුතු වන්නේ** නිවසේ අයිතිය එක් හෝ පුද්ගලයින් කීපදෙනෙක් සතුව ඇති විට හෝ එකම නිවාසය බෙදාගෙන සිටින තත්වයකදී, අවම තරමින් එයින් එක් පුද්ගලයෙක් හෝ එහි පදිංචි වී සිටින්නේ නම් පලමු කොටුවේ කතිරය ගැසිය යුතුවේ. එසේම පරිහරණය සහ පදිංචිය සඳහා සුදුසු තත්වයේ නිවසක් වන්දියක් ලෙස නැතහොත් ජීවිත භුක්තිය මත විකුණා හෝ අයිතිකරු තම නිවස කුලියට දී එම නිවසේම පදිංචි වී ඇති තත්වයක් තුලද 1වන කොටුවේ කතිර ගැසිය හැකිය.
**අංක 2 හෝ 3 ට කතිරය ගැසිය යුතු වන්නේ එම වාසස්ථානයෙහි පදිංචිව සිටින පුද්ගලයන් එහි අයිතිකරු නොවනවා නම් පමණක් නොව තමා කුලියට ඉන්නවා නම් පමණක්(අංක 2), හෝ වෙනත් පදනමක් මත එහි වාසය කරනවා නම්** (අංක 3), **නැතහොත් නොමිලේ පදිංචිය හෝ සේවයක් කරන ස්ථානයක පදිංචිව සිටින පුද්ගලයන් පදිංචිව සිටින පුද්ගලයන් නම් පමණි.**

## 1 රේජිස්ටර් කන්තෝරුවේ සදහන් විස්තර

***මෙම පවුලේ විස්තර සදහන් පත්‍රිකාවේගෘහමූලිකයා සමග වෙසෙන තම නෑදෑයන් ගැන හෝ එහි ජිවත් වන පුද්ගලයන් ගැනද, ඔවුන්ගේ ලිංගිකතාවයද, ඔවුන්ගේ විවාහ අවිවාහක භාවයද,ඔවුන් විවාහ වු දිනයද, සදහන් කළ යතු වන්නේ මෙම පවුල් වල සහ පවුලේ අයගේ වැඩි විස්තර දැන්වීම සදහාය. විශේෂයෙන්ම මෙම ප්‍රශ්නයන්ට පිලිතුරු සැපයිමෙන් පවුල් වල වැඩි විස්තරද සාමාජිකයන් ගැනද කිදෙනෙක් සිටින වග සහ වැඩි විස්තර ලබා ගත හැක.(උදාහරණයක් වශයෙන් ගත් කල ළමයින් සමග සිටින පවුල් ගැනද, දෙමාපිය එක් කෙනෙතු සමග ජිවත් වන පවුල් ගැනද, දෙමාපිය එක් කෙනෙතු සමග ජිවත් වන දරුවන් ගණන ගැනද තනිව ජිවත් වන පුද්ගලයන් ගැනද යනුවෙන්ය)***

**ප්‍රශ්න අංක 1.1**

**මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිමේදි පවුලේ විස්තර සදහන් පත්‍රිකාවේ** ගෘහමූලිකයා **සමග වෙසෙන තම නෑදෑයන් ගැන හෝ එහි ජිවත් වන පුද්ගලයන් ගැනද සදහන් කල යුතුය. පවුලේ විස්තර සදහන් පත්‍රිකාවේ** ගෘහමූලිකයා **වශයෙන් සදහන් කරනුයේ රෙජිස්ටර් කන්තෝරුවේ ලියා පදිංච්චි ඇති** ගෘහමූලිකයා. **පවුලේ විස්තර සදහන් පත්‍රිකාවේ** ගෘහමූලිකයා **වශයෙන් සදහන් කරනුයේ රෙජිස්ටර් කන්තෝරුවේ ලියා පදිංච්චි ඇති** ගෘහමූලිකයාටය.

- **පවුලේ විස්තර සදහන් පත්‍රිකාවේ** ගෘහමූලිකයා **හෝ එකි අදාල පුද්ගලයා මෙම ප්‍රශ්නයට පිලිතුරු දිය යුතු නැත.**(A **ලැයිස්තුවේ අංක** 01 **හි සදහන් පුද්ගලයා**); **මෙම ප්‍රශ්නයට පිලිතුරු සපයා ඇත.**
- සම ලිංගික හෝ ද්වී ලිංගිකත්වයෙන් යුත් යුවලක් ලෙස පවුලේ විස්තර සඳහන් පත්රිකාවේ ගෘහමූලිකයා සමග එක්ව යුවලක් ලෙස ජීවත්වෙන්නෙක් වේ නම් **03** කෝටුවේ කතිරය යොදන්න.
- **දරුවන් යනුවෙන් සදහන් වන්නේ පවුලේ විස්තර සදහන් පත්‍රිකාවේ** ගෘහමූලිකයා **විසින් හදුනා ගත් දරුවන් හෝ/සහ තම භාර්යාව හෝ එකට ජිවත් වන පුද්ගලයාගෙන් ලද දරුවන්ය.**
- මෙම පත්රිකාවේ සඳහන් ගෘහමූලිකයාට දාව විවාහකව හෝ විවාහ නොවී එක්ව ජීවත් වන ඔහු හෝ ඇයට ලද දරුවන් වේ නම් අංක **06(**විවාහකව හෝ අවිවාහකව ජීවත්වන්නාගේ පිරිමි හෝ ගැහැණු දරුවන් පමනක්) කොටුවේ කතිරය යොදන්න. **දෙමාපිය දෙදෙනාගෙන් එක් අයකු මිය ගොස් සිටි නම් හෝ මෙම නිවසෙහි ජිවත් නොවනවා නම් පමණක් වනවා ඇත.**
- ගෘහමූලිකයාගේ **දෙමාපියන් ගැනද**ගෘහමූලිකයාගේ **මාමාණ්ඩි සහ නැන්දම්මා ගැනද) එකට ජිවත්වන පුද්ගලයාගේ දෙමාපියන් ගැන** හෝ විවාහ සිටින්නාගේ දෙමාපියන් ගැන **විස්තර සැපයිම සදහා මෙහි අංක 08 දරණ කොටුවට කතිරයක් ගසන්න.**
- ගෘහමූලිකයාගේ **භාර්යාව හෝ එකට ජිවත්වන පුද්ගලයාගේ ගැන විස්තර සදහන් කරන විට අදාලකොටුවට පමණක් කතිරය ගහන්න. තවද**ගෘහමූලිකයාගේ **භාර්යාව හෝ එකට ජිවත් වන පුද්ගලයා මෙම නිවසෙහි ජිවත් නොවනවා නම්ද එයද සදහන් කල යුතුය.**
- ගෘහමූලිකයාගේ **නෑදෑයින් හෝ ඔහුගේ භාර්යාව හෝ එකට ජිවත් වන පුද්ගලයාගේ විස්තර ඉහත පිලිතුරු වල සටහන් කර නැත්නම්**ගෘහමූලිකයාගේත් **ඔහුගේ භාර්යාව හෝ එකට ජිවත් වන පුද්ගලයාගේ මාමලා, නැනලා, මස්සිනා ඇතුලු සහෝදර සහෝදරියන්ද යනුවෙන්ය)මෙම නිවසෙහි ජිවත් වන පුද්ගලයන්ගේ විස්තර සැපයිම සදහා මෙහි අංක 16 දරණ කොටුවට කතිරයක් ගසන්න.** (ගෘහමූලිකයා **වෙනත් නෑදෑයින් හෝ ඔහුගේ භාර්යාව හෝ එකට ජිවත් වන පුද්ගලයාගේ නෑදෑයින්ද යනුවෙනි)**
- **මෙම නිවසෙහි සෑම දිනම පදිංචවි සිටින** ගෘහමූලිකයාගේත් **ඔහුගේ භාර්යාව හෝ එකට ජිවත් වන පුද්ගලයාට නෑ කමක් නොමැති පුද්ගලයන්ගේ විස්තර සැපයිම සදහා මෙහි අංක 17 දරණ කොටුවට කතිරයක් ගසන්න.("නෑ කමක් හෝ තමන් හා සම්බන්ධ නොමැති වෙනත් පදිංච්ච සිටින පුද්ගලයන් යනුවෙන්ය) යම් විදියහින් මෙම පුද්ගලයන් එක පවුලක්වේ නම් ඔවුන්ද වෙනම පවුලේ විස්තර සදහන් පත්‍රිකාවක් පිරවිය යුතුය.**
- **ඔබ පවුලේ වැඩ කිරිම සදහා නිවසෙහි නිතර පදිංච්ච වැඩකාරයන් සිටිද**ගෘහ **සේවකයන් සහ පවුලේ වැඩට උපස්ථාන කරන අය)එවිට එම පුද්ගලයන්ගේ විස්තර සැපයිම සදහා මෙහි අංක 17 දරණ කොටුවට කතිරයක් ගසන්න. යම් විදියකින් මෙම පුද්ගලයන් වෙනම පවුලක් ලෙස වෙසෙනවා නම් එවිට ඔවුන්ද පවුලේ විස්තර සදහන් පත්‍රිකාවක් වෙනම පිරවිය යුතුය.**

**ප්‍රශ්න අංක 1.2**

***සංගණනය සදහා "ලිංගිකත්වය" අත්‍යවශ්‍යය ලෙස වෙනස් වන මුලික කරුණක් බැවින්*** *ගැහැණු* ***සහ*** *පිරිමි* ***ගැන විශේෂයෙන් සදහන් කරන්න.***

**ප්‍රශ්න අංක 1.3**

***මෙම ප්‍රශ්නයෙහි උපන් දිනය අත්‍යාවශ්‍යය වනුයේ වයස් සිමාව අවුරුදු ගණනින් සාදා ගැනිම සදහා නිසාත් අවම වශයෙන් නිවැරදි වයස් සිමාවන් ලබා ගැනිම සදහාත්ය.***

**අනිවාර්යෙන්ම උපන් දිනය සදහන් කල යුත්තේ ඉලක්කන් වලින් මිස අකුරු වලින් නොවේය.දිනය සහ මාසය ඉලක්කන් දෙකකින් සමන්විය යුතු අතර ඉන් ඉදිරියට බිංදුව දමා ලිය යුතුය.(උදා:** 05/06/1967 **යනුවෙන්ය** ).

**ප්‍රශ්න අංක 1.4**

***මෙම ප්‍රශ්නයෙහි උපන් ස්ථානය(ඔබ උපන්න ස්ථානයවේ)අනිකුත් විස්තර සඳහා අවශ්‍යය වන අතර (උදාහරණයක් වශයෙන් ගත් කල තමන්ගේ ස්ථිර පදිංචි ස්ථානය)මෙහි පදිංචිව සිටින පුද්ගලයන් ඉතාලිය ඇතුලත යන ස්ථානයන්ද ඉතාලිය සහ අනිතුත් රටවල් අතර යන ස්ථානයන්ද සඳහන් කල යුතුය.***

- **මෙහි ස්ථිර පදිංචි ස්ථානයෙහි උපන් පුද්ගලයන් මෙහි අංක 1 දරණ කොටුවට කතිරයක් ගසන්න.("මෙම නගර සභාවේදි")**
- **ඉතාලියේ වෙනත් නගර සභාවන්හිදි උපන් පුද්ගලයන් අදාල නගර සභාවේ නම ඇතුලු විස්තර සඳහන් කල යුතුය. අදාල නගර සභාවේ නම ඇතුලු විස්තර සඳහන් කර යුතු අතර ඔබ ගැවසෙන ස්ථානය නොවේ.(කුඩා ගම්මාන, අදාල පුද්ගලයන් ජිවත් වන ස්ථානයන් යනාදිය)තවද මෙම සංගණනය සිදු කරන අවස්ථාවේදි ඔබ සිටින නගරය අයත් පළාතේ සංකේතය අනිවාර්යෙන් සඳහන් කළ යුතුය.**
- **විදේශ රටක උපන් පුද්ගලයන් අදාල රටට අයත් සංකේතය අනිවාර්යෙන් සඳහන් කළ යුතු වන්නේ උපන් ස්ථානයද සඳහන් කිරිමෙන්ය. විදේශ රටක උපන් පුද්ගලයන්ගේ රට ලතින් අකුරු වලින් සහ ඉතාලි භාෂාවෙන් සඳහන් විය යුතුය.**

**ප්‍රශ්න අංක 1.5**

***මෙම ප්‍රශ්නයේ සඳහන් වන අදාල නගර සභාවේ ලියා පදිංචිවිම මගින් අදාල පුද්ගලයාගේ ස්ථිර වශයෙන්ම පදිංචි ස්ථානය තහවුරු කර ගත හැක. අදාල නගර සභාවේ ලියා පදිංචිවිම මගින් තම හැදුනුම් පත සහ අදාල නගර සභා සහතික පත්‍ර ලබා ගැනිමට හැක. ගෘහමුලිකයා විසින් අදාල පවුල් පත්‍රිකාවේ පළවන පිටුවේ ඔබගේ ලිපිනය මින් පෙර සඳහන් කර නැත්නම් පමණක් මෙම ප්‍රශ්නයට පිලිතුරු සපයන්න.***

- **අදාල නගර සභාවේ ලියා පදිංචි පුද්ගලයන් සංගණනයේදි අංක 1 දරණ කොටුවට කතිරයක්** ("ඔව්, **යනුවෙන් සඳහන් කළ යුතු වන්නේ මෙම වාසස්ථානයේ නම් පමණි) හෝ අංක 2 දරණ කොටුවට කතිරයක් ගසන්න.**("ඔව්, **යනුවෙන් සඳහන් කළ යුතු වන්නේ වෙනත් නිවසක හෝ එකට ජිවත්වනවා නම් පමණි")**
- **වෙනත් ඉතාලි නගර සභාවක ලියා පදිංචි පුද්ගලයන් ඔවුන් ලියා පදිංචිව සිටින නගර සභාව සඳහන් කල යුතුය. මෙහි සඳහන් කල යුත්තේ අදාල නගර සභාව පිහිටි ස්ථානය මිස ඔබ ගැවසෙන ස්ථානය නොවේ.**(කුඩා ගම්මාන, අදාල පුද්ගලයන් ජිවත් වන ස්ථානයන් යනාදිය)තවද ඔබ සිටින නගරය අයත් පළාතේ සංකේතය අනිවාර්යෙන් සඳහන් කළ යුතුය. **ඉතාලියේ යම් කිසි නගර**
- **සභාවක ලියා පදිංචි නොවි සිටින පුද්ගලයන් අංක 4 දරණ කොටුවට කතිරයක් ගසන්න.** ("නැත" **කිසිම නගර සභාවක ලියා පදිංචිව නැත)**

***විශේෂයෙන්ම දන්වන්නේ එකට* ජිවත්වනවා(කොන්විවෙන්සා) *යනුවෙන් උදාහරණයක් වශයෙන් ගත් කල: අධ්‍යාපන ආයතනයන්(කොලෙජ්, සෙමිනරි යනාදිය)උපකාර කිරිමේ ආයතනයන්(අනාථ දරු නිවාස, පවුල් සඳහා ඇති ආයතන, මහලු මඩම් සහ ආබාධිතයින් සඳහා ඇති ආයතනයන් යනාදිය) උදව් උපකාර කිරිමේ ආයතනයන (රෝහල්, ක්ලිනික් යනාදිය), බන්ධනාගාර, දේව ගැති රැඳවුම් ස්ථානයන්, හමුදා මුලස්ථානය (හමුදා රෝහල්, හමුදා බන්ධනාගාර, හමුදා කඳවුරු යනාදිය) හෝටල්, කුඩා හෝටල්, කාමර කුලියට දෙන ස්ථානයන් සහ ඒ හා සමාන ස්ථානයන්, යාත්‍රාකරන වෙළද නැව් (මුහුදු යාත්‍ර වාරිකා කරන නැව් යනාදිය) යනාදිය***

## 2 සිවිල් සමාජීය තත්වය සහ විවාහය

**ප්‍රශ්න අංක 2.1**

- **යම් අවස්ථාවක විවාහවු පුද්ගලයන් නොගැලපිමක් මත එකට ජිවත් නොවේ නම් අංක 3 දරණ කොටුවට(**නිත්‍යාණුකූල නොවන අයුරින් ඔහු/ඇය වෙන්ව සිටී**) කතිරයක් ගසන්න.** "විවාහකයි ඇය/ඔහු" යනුවෙන් සඳහන් **අංක 2 දරණ කොටුව නොවේ.**
- **යම් අවස්ථාවක විවාහවු පුද්ගලයන් රැකියාවක් නිසා හෝ අත්‍යාවශ්‍යය තාවයක් නිසා දුරස්ව ජිවත්වනවා නම් අංක 2 දරණ කොටුවට කතිරයක් ගැසිය යුතු අතර ("**ඔහු හෝ ඇය විවාහකයින් නම්**") අංක 3 දරණ කොටුවට කතිරයක් නොගසන්න. "**ඔහු හෝ ඇය ස්ථිරවම වෙන්ව ජීවත් වනවා නම්
- **"විවාහවි සිටින" පුද්ගලයන්**(**දික්කාසාදය ලබා ගත් හෝ** 1970 **දෙසැම්බර් මස 1 වන දින නිති අංක** 898 **යටතේ නිත්‍යානුකුලව වෙන්වි සිටින**) **අංක 5 දරණ කොටුවට කතිරයක් ගසන්න.** ඔහු හෝ ඇය දික්කසාද වී ඇත්නම්

**ප්‍රශ්න අංක 2.2**

- **මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුත්තේ එක් විවාහයක් හරි කර ගත් පුද්ගලයන්ය.** නිත්‍යාණුකූව හෝ නිත්‍යාණුකූල නොවන අයුරින් **ජිවත් වනවා නම්ද දික්කසාදවු හෝ වැන්දඹු අයද මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුතුය.**
- **විවාහවු දිනය ඉලක්කන් වලින් මිස අකුරෙන් නොලියන්න.** (උදා: 05/1969); **විවිධ විවාහයන් සිදු කර ගත් පුද්ගලයන් අවසන් වරට විවහවු දිනය සඳහන් කරන්න.**

**ප්‍රශ්න අංක 2.3**
***අවසන් වරට විවාහවු පුද්ගලයන්ගේ විවාහක අවිවාහක තාවය වැඩි විස්තර රැස් කර ගැනිම සදහා ප්‍රයෝජන වන අතර තම පවුලේ සාමාජිකයින්ගේ විස්තර ගැනිම සදහා ප්‍රයෝජන වේ***

**මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුත්තේ අවසන් වරට විවහ විමට ප්‍රථම තම පවුලේ තත්වය ගැන විස්තරය සදහන් කරමින්ය.යම් විදියකින් එක් විවාහයක් පමණක් කර ගෙන ඇත්නම්ද රට ප්‍රථම තම පවුලේ තත්වය ගැන විස්තරය සදහන් කරන්න.**
**මෙම ප්‍රශ්නයට එක් විවාහයක් පමණක් කර ගෙන ඇති පුද්ගලයන්ද නිත්‍යානුකූලව වෙන්වි ජිවත් වනවා නම් හෝ වෙන් වෙන්ව ජිවත් වනවා නම්ද දික්කසාදවු හෝ වැන්දඹු අයද පිලිතුරු සැපයිය යුතුය.**

## 3 පුරවැසිභාවය

***පුරවැසිභාවය පිලිබදව ඇති මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිමෙන් බලාපොරොත්තු වන්නේ ඉතාලියේ ස්ථිර පදිංචිව සිටින පුද්ගලයන්ගෙන් ඉතාලි පුරවැසිභාවය ලද අය හෝ*** *වෙනත්* ***රටක පුරවැසිභාවය ලද අය ගැන විස්තර*** *දැන ගැනීමයි.*
***තවද ඉතාලියේ ස්ථිර පදිංචිව සිටින පුද්ගලයන්ගේ වයසට අනුවද ඔබ පුරවැසිභාවය පිලිබදව ඇති මෙම ප්‍රශ්නයට සපයා ඇති පිලිතුරුවලටද අනුව උදාහරණයක් වශයෙන් ගත් කල කී දෙනෙක්ට ජන්ද බලය අයිතිද ~~යන්නද~~, ඔවුන්ගේ වැඩි විස්තරද දැන ගත හැක. තම දෙමාපියන්ගේ උපන් ස්ථානයද (මවගේ සහ පියාගේ) සදහන් කිරිමෙන් තනි පුද්ගලයන්ගේ උත්පත්තියද විශේෂයෙන්ම විදේශිකයන්ගේ සහ ඔවුන් ගෙන් පැවත එන අය ගැන විස්තර ලබා ගත හැක.***

**ප්‍රශ්න අංක 3.1**
- **මෙහි විදේශ රටක පුරවැසිභාවය ඇති පුද්ගලයන් අංක 2 දරණ කොටුවට කතිරයක් ගහන්න. විශේෂයෙන්ම තම පුරවැසිභාවය ඇති රට ලතින්** අකුරුවලින් **වලින් සහ ඉතාලි භාෂාවෙන් සදහන් කරන්න.**
- **ඉතාලි පුරවැසිභාවය සහ වෙනත් රටක පුරවැසිභාවය ඇති පුද්ගලයන්, ඉතාලි පුරවැසිභාවය පමණක් සදහන් කල යුතුය.( අංක 1 දරණ කොටුවට කතිරයක් ගහන්න)**
- **විවිධ රට වල පුරවැසිභාවය ඇති පුද්ගලයන්(ඉතාලි පුරවැසිභාවය හැරුණු විට)එක් පුරවැසිභාවයක් ඇති රටක් පමණක් සදහන් කල යුතු අතර** මේ සඳහා පහතින් සඳහන් මූලික කරුණු දෙක එනම් **a)**යුරෝපා හවුලට අයත් රටක් වීම, **b)**වෙනත් රටක් වීම යන්න සැලකිල්ලට ගන්න. ඒ අනුව රටවල් කීපයක පුරවැසිභාවය ලත් පුද්ගලයෙකු වේ නම් ඔහු අයත් වන්නේ **a)** ද **b)**ද යන්න සැලකිල්ලට ගනිමින් එක් රටක් පමනක් සඳහන් කරන්න.
- **යම්කිසි රටක පුරවැසිභාවය නොමැති පුද්ගලයන් රජයකට අයිති නැති(අපොලිඩ්) ලෙස සදහන් කරන්න.(අංක 3 දරණ කොටුවට කතිරයක් ගහන්න.)** එමෙන්ම පුරවැසිභාවය පිළිබඳව පැහැදිලිතාවයක් නොමැති පුද්ගලයින්ද "අපෝලිඩ්" තත්වයේ ලා සලකණු ලබන අතර රාජ්යයන් අහෝසිවී යාම, බෙදීයාම සහ රාජ්යයන් එකසත් වීම පුරවැසිභාවයන් අපැහැදිලිවීමට බලපානු ලබන කාරණාවන් වේ.

**ප්‍රශ්න අංක 3.2**
- **උත්පත්තියෙන්ම ඉතාලි පුරවැසිභාවය ලබා ඇති පුද්ගලයන් අංක 1** ("ඔව්"), **දරණ කොටුවටද කතිරයක් ගැසිය යුතු අතර වෙනත් රටක උපත ලබා ඇති නමද මේලෙස සදහන් කරන්න.**
- නිශ්චිත හේතූන්මත හෝ විවාහය, ස්වාභාවික හෝ සුවිශේෂී තත්වයක් නිසා හෝ වසර 18ක් එක දිගට උපතේ සිට ඉතාලියේ ඉඳීම යන කරුණු මත රජයේ පූර්ණ අවසර ඇතිව පුරවැසිභාවලද පුද්ගලයින් **අංක 2** ("නැත"), **දරණ කොටුවටද කතිරයක් ගැසිය යුතුය.තවද අංක 2, දරණ කොටුවටද කතිරයක් ගැසිය යුතු වන්නේ ඉතාලි පුරවැසිභාවය** ස්වයංව හිමිව ඇති පුද්ගලයින් **වන අතර උදාහරණයක් වශයෙන් ගත් කල**:
  a) **බාල වයස් ළදරුවන් ඉතාලි පුරවැසිභාවය ලබා ඇත්තේ තමා ඉතාලි ජාතිකයකු විසින් දරුකමට අරන් සාදා ගන්නා ලද ළදරුවෙක් විම හෝ ඉතාලි ජාතික මව හෝ පියා විසින්( නිත්‍යානුකූලව ළදරුවෙක් ලෙස සාදා ගත් ලියකියවිලිද සමග) හදූනා ගත් ළදරුවෙක් විමය;**
  b) **ඉතාලි ජාතිකයකු විසින් එකට ජිවත් වන බාල වයස් ළදරුවන්හට ඉතාලි පුරවැසිභාවය ලබා දි ඇත්නම් යනුවෙන්ය.**

**ප්‍රශ්න අංක 3.3**
යමෙකු ප්රශ්ණ අංක **3. 2** යටතේ අංක **2** දරණ කොටුවට කතිරය ගසා ඇත්නම්**(**ඉතාලි ජාතිකයෙක් නමුත් උපතේ සිට නොවේ**):**
- **මෙහි විශේෂයෙන්ම විවාහය නිසා පුරවැසිභාවය ලබා ඇති පුද්ගලයන්ද නැතහොත් වෙනත් කරුණක් නිසා ලත් පුරවැසිභාවයක් ලබා ඇති පුද්ගලයන්ද යනුවෙන් සදහන් කල යුතුය.**
- **මෙහි මින් පෙර තමා උපන් රටෙහි පුරවැසිභාවය ගැනද ලතින්** අකුරුවලින් **වලින් සහ ඉතාලි භාෂාවෙන් සදහන් කල යුතුය.**

**ප්‍රශ්න අංක 3.4** සහ **3.5**
යම්හෙයකින් දෙමාපියන් පිට රටක ඉපදී ඇත්නම්**,** එම රටට දැන් කියන නම සහ දේශ සීමා ඇත්නම් ඒවාත්**,** උපන් ස්ථානයත් සඳහන් කරන්න. **අදාල රටෙහි නම ලතින්** (අකුරු)**වලින් සහ ඉතාලි භාෂාවෙන් සදහන් කල යුතුය.**

## 4 මේ මොහොතේ සහ මීන් පෙර පදිංචිය

***අංක 4 යන ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුත්තේ සංක්‍රමිකයන් වන මෙහි ඇතුලත සිටින සහ ජාත්‍යාන්තර වශයෙන් සිටින අය ගැන වෙන් කර දැන ගැනිම සඳහාය. ඇතුලත සිටින සංක්‍රමිකයන් යනු මෙම සංගණය කරන කාලය තුල යම්කිසි නගර සභාවක පදිංචිව සිටින අය වන අතර මිට ප්‍රථම වෙනත් නගර සභාවක පදිංචිව සිටින අයද වනු ඇත. ජාත්‍යාන්තර සංක්‍රමිකයන් යනු උපන් හෝ පුරවැසිභාවය ඇති රට කෙසේ වෙතත් තම ජිවිතයේ එක් අවස්ථාවකදි හෝ වෙනත් රටක ස්ථිර ලෙස පදිංචිව සිටින පුද්ගලයන්ය.***

**ප්‍රශ්න අංක 4.1**
***මෙම සංගණය සිදු කරන අවස්ථාවේදි ඔබ සිටින ස්ථානයට කතිරයක් ගසන්න.***
**අංක 1 ට (**“මෙම පදිංචි ස්ථානයේ”**) හෝ අංක 2 ට (**“මෙම නගරසභාවේ එහෙත් වෙනත් නිවසක, එකට ජීවත්වන” **යනුවෙනි)කතිරයක් ගැසිය යුතුය. මෙම පුද්ගලයා** 2011 **ඔක්තොම්බර් මස** 9 **වනදා සිට එහි පදිංචිව සිට නැත්නම්ද** 2011 **ඔක්තෝම්බර් මස 10 වන දින එහි නැවත පැමිණියහොත් වෙනත් නගර සභාවක සංගණනය කර නොමැති නම් මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුතුය.**

***විශේෂයෙන්ම දන්වා සිටිනුයේ එකට ජිවත්වනවා (කොන්විවෙන්සා) යනුවෙන් සඳහන් කරනුයේ උදාහරණයක් වශයෙන් ගත් කල (අධ්‍යාපන ආයතනයන්(කොලෙජ්) සෙමිනාරි යනාදිය)උපකාර කිරිමේ ආයතනයන්(අනාථ දරු නිවාස, පවුල් සඳහා ඇති ආයතන, මහලු මඩම් සහ ආබාධිතයින් සඳහා ඇති ආයතනයන් යනාදිය) උදව් උපකාර කිරිමේ ආයතනයක (රෝහල්, ක්ලිනික් යනාදිය), බන්ධනාගාර, දේව ගැති රැඳවුම් ස්ථානයන්, හමුදා මුලස්ථානය (හමුදා රෝහල්, හමුදා බන්ධනාගාර, හමුදා කඳවුරු යනාදිය) හෝටල්, කුඩා හෝටල්, කාමර කුලියට දෙන ස්ථානයන් සහ ඒ හා සමාන*** **ස්ථානයන්, යාත්‍රාකරන වෙළඳ නැව් (මුහුදු යාත්‍ර චාරිකා කරන නැව් යනාදිය) යනාදිය**

**ප්‍රශ්න අංක 4.2** *(මෙම ප්‍රශ්නයට පිලිතුරු දිය යුත්තේ වයස අවුරුදු 1 කට හෝ වැඩි අය පමණි)*
**මෙහි 3 වන කොටුවට කතිර ගැසුවා නම් (අවුරුද්දකට ප්‍රථම ඉතාලියේ වෙනත් නගරයක පදිංචිව සිටියා නම්)අදාල පදිංචිව සිටි නගර සභාවේ නම සඳහන් කල යුතුය. අදාල පදිංචිව සිටි නගර සභාවේ නම පමණක් සඳහන් කල යුතු අතර ඔබ ගැවසෙන ස්ථානය නොවේ.(කුඩා ගම්මාන [ෆ්‍රත්සියෝනි], අදාල පුද්ගලයන් ජිවත් වන ස්ථානයන් යනාදිය)**
**මෙහි 4 වන කොටුවට කතිර ගැසුවා නම්(අවුරුද්දකට ප්‍රථම වෙනත් රටක පදිංචිව සිටියා නම්) අදාල පදිංචිව සිටි රටෙහි නම ලතින් අකුරු වලින් සහ ඉතාලි භාෂාවෙන් පමණක් සඳහන් කල යුතුය.**

**ප්‍රශ්න අංක 4.3** *(මෙම ප්‍රශ්නයට පිලිතුරු දිය යුත්තේ වයස අවුරුදු 5 ක් හෝ ඊට වැඩි අය පමණි)*
**මෙහි 3 වන කොටුවට කතිර ගැසු අය (අවුරුදු 5 කට ප්‍රථම ඉතාලියේ වෙනත් නගරයක පදිංචිව සිටියා නම්)අදාල පදිංචිව සිටි නගර සභාවේ නම සඳහන් කල යුතුය. අදාල පදිංචිව සිටි නගර සභාවේ නම පමණක් සඳහන් කල යුතු අතර ඔබ ගැවසෙන ස්ථානය නොවේ.(කුඩා ගම්මාන,**
**අදාල පුද්ගලයන් ජිවත් වන ස්ථානයන් යනාදිය)**
**මෙහි 4 වන කොටුවට කතිර ගැසු අය (අවුරුදු 5 කට ප්‍රථම විදේශ රටක පදිංචිව සිටියා නම්) අදාල පදිංචිව සිටි නගර සභාවේ නම සඳහන් කල යුතුය. අදාල පදිංචිව සිටි රටෙහි නම සඳහන් කල යුත්තේ ලතින් අකුරු වලින් සහ ඉතාලි භාෂාවෙන් පමණි.**

## 5 අධ්‍යාපනය සහ පුහුණුව

**ප්‍රශ්න අංක 5.1** (වයස අවුරුදු 6 හෝ ඊට වැඩි දරුවන්)

**මෙම ලැයිස්තුවෙහි සදහන් වන අධ්‍යාපන සුදුසුකම් ඉතාලි අධ්‍යාපන ක්‍රමයට අනුකූලව ඇති බව සලකන්න**

– elementare හෙවත් scuola primaria සඳහා සහභාගි වන ළමුන් අංක **02** දරණ කොටුවට කතිරය ගසන්න.

– **එකම අංශයේ අධ්‍යාපන සුදුසුකම් එකක් හෝ ඊට වැඩිය ඇත්නම් එම පුද්ගලයන් එහි වැදගත් යැයි සිතන අධ්‍යාපන සුදුසුකම් පත්‍රයට කතිරයක් ගසන්න.**

– **අනිකුත් පුද්ගලයන්** (විදේශිකයින්) **විදේශ රටක උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත්නම් ඔවුන් ඉතාලි අධ්‍යාපන ක්‍රමයට අනුකූලව ඇති කොටුවට කතිරයක් ගසන්න.**

– **විදේශික පුද්ගලයන් කිසියම් අධ්‍යාපන සුදුසුකම් ලබා නොමැතිනම් ඔවුන් අංක 01 ක්‍රමයේ (කිසියම් අධ්‍යාපන සුදුසුකම් ලබා නොමැතිවද ලිවිමට සහ කියවිමට නොදන්නා වගද) හෝ අංක 02 ක්‍රමයේ (කිසියම් අධ්‍යාපන සුදුසුකම් ලබා නොමැතිවද ලිවිමට සහ කියවිමට දන්නා වගද) ඇති කොටුවට කතිරයක් ගැසිම සිදු කල යුතු වන්නේ තම මවු බස කුමක්ද යන වගද සදහන් කරමින්ය.**

***ප්‍රශ්න අංක 5.1 ට පිලිතුරු සපයන පුද්ගලයන් පහත සදහන් කරුණු අවබෝධ කර ගෙන එම අදාල ක්‍රමයට අනුව පිලිතුරු සපයන්න:***

**අංක 03 වන ආකාරය : ලිචෙන්සා එලෙමේන්තාරේ(**Licenza di scuola elementare**) (හෝ අවසන් වරට ලද ලකුණු වලට සමානවිම-**valutazione finale equivalente**) යනු මූලික අධ්‍යාපන ක්‍රමයේ පළවන අදියරය අවසන් කර තිබිමය. ලිචෙන්සා එලෙමේන්තාරේ යනු සාමාන්‍යය අධ්‍යාපන ක්‍රමයට අනුව පාසැල් අවසානයේදි නිකුත් කරන ලද සහතිකය වන අතර එය** C **වර්ගයට අයත්ය.**

**අංක 04 වන ආකාරය: ලිචෙන්සා දි ස්ක්වාලා මේඩයා(**Licenza di scuola media**) (**o di avviamento professionale**)** මධ්‍යම පාසල් මට්ටම් සැලසුම්ගතව එක් කිරීමට ප්‍රථම වූ ද්විතික පාසල් මට්ටමේ මූලික පදනමේ සිට වලංගු වේ**.** මෙම පාසල් මට්ටමට පිවිසීම සඳහා scuola elementare සම්පූර්ණ කර තිබිය යුතුය**.(**හෝ අවසාන ඇගයීම් ලකුණු සමාන විය යුතුය**.)**

**අංක 05 වන ආකාරය: ඩිප්ලෝමා දි ස්ක්වෝලා සෙකොන්දාරියා සුපෙරියෝරේ වසර 2-3 ක කාලයක් යනු**:

- <u>උසස්පෙල දිවිතික මට්ටමේ(</u>secondaria superiore<u>)</u> ඩිප්ලෝමාමාවක්: මගින් වෘතීය පුහුණු ආයථනයක් හෝ ස්ක්වෝල මජිස්ත්‍රාලෙ(Licenza di scuola magistrale) හෝ ඉස්තිතූතෝ දි ආර්තෙ(Istituto d’arte) ආයථන සඳහා සුදුසුකම් හිමිවෙයි. එමගින් විශ්වවිද්‍යාලීය සුදුසුකම් හිමි නොවන එහෙත් වෘතීය පුහුණු පාඨමාලාවක් හෝ ස්ක්වෝල මජිස්ත්‍රාලෙ(Scuola magistrale) හෝ ඉස්තිතූතෝ දි ආර්තෙ (Istituto d’arte) හෝ ඉස්තිතූතෝ ටෙක්නිකෝ හෝ ඉස්තිතෝ මජිස්ත්‍රාලෙ (Istituto tecnico o Istituto magistrale) යන පාඨමාලාවන් සහා සුදුසුකම් හිමිවෙයි. මෙම පාඨමාලා කාලය වසර 4ට අඩුකාලයක්(වසර 2-3 ත් අතර කාලයක්) වන අතර ඒ සඳහා ලිචෙන්සා දි ස්කුවෝල මේඩියා(licenza di scuola media) සහතිකය අනිවාර්ය වේ.
- <u>මෙහි ඉහල/මධ්‍යම සංගීතය පිළිබඳ උසස් ආයථනය(</u>Conservatorio musicale<u>) සහ ජාතික නර්තන ඇකඩමි(</u>Accademia Nazionale di Danza<u>) (වසර 2-3ත් අතර)</u>

**මෙම අධ්‍යපන සුදුසුකම** සංගීතය පිළිබඳ උසස් ආයථනයක**(**Conservatori di Musica**) හෝ** ජාතික **නර්තනය** ඇකඩමි**(**Accademia Nazionale di Danza) **පාඨමාලාවක් වසර 1999දි සිදුවු සංශෝධනයට ප්‍රථම(නිති අංක 508/99)අවසන් කල තිබිය යුතුව ඇත**.

**ඒ අනුව මෙම සුදුසුකම සංගීතය පිළිබඳ උසස් ආයථනයක(**Conservatorio musicale**) හෝ** ජාතික **නර්තනය** ඇකඩමි**(**Accademia Nazionale di Danza**) පාඨමාලාවක්හැදෑරිමෙන් පසුව ලද ඩිප්ලොමාවක් වන අතර එය secondaria superiore** පාසැල් **ඩිප්ලෝමාවක් <u>නොවිය යුතුය</u>.**

ඒ අනුව සංගීතය පිළිබඳ උසස් ආයථනයේ**(Conservatorio musicale)** හෝ නර්ථනයට හෝ උසස්පෙල ද්විතික මට්ටමේ(Scuola secondaria superiore) කඩිප්ලෝමාවක් ඇති අය 07 වන කෝටුවට කතිරය ගසන්නග(“කලාශිල්ප පිළිබඳ ඩිප්ලෝමාව-Diploma di Accademia di Belle Arti“ වැනි...)

**අංක 06 වන ආකාරය:** වසර 4-5ත් තරම් කාලයක් ගත වන උසස් අධ්‍යාපනික ද්විතික(Scuola secondaria superiore) මට්ටමේ ඩිප්ලෝමාවක් සඳහා ඉහල අධ්‍යාපනික (සම්භාව්‍ය, විද්‍යා,වාග්විද්‍යා, කලා හෝ සමාජ-මනෝවිද්‍යා-ශික්ෂණ--- Liceo classico o scientifico o linguistico o artistico o socio-psico-pedagogico) ආයථනයක වෘතීය පුහුණු ආයථනයක (Istituto professionale) හෝ ස්කුවෝල මජිස්ත්‍රාලෙ(Scuola magistrale) හෝ ඉස්තිතූතෝ දි ආර්තෙ (Istituto d’arte) හෝ ඉස්තිතෝ තෙක්නිකෝ(Istituto tecnico) හෝ ඉස්තිතූතෝ මජිස්ත්‍රාලෙ (Istituto magistrale) යන අංශයන් හී අධ්‍යාපනය හැදෑරිය යුතු අතර එමගින් විශ්වවිද්‍යාලීය පාඨමාලාවක් සඳහා ඉල්ලුම් කල හැක. එහෙත් ඉහත සඳහන් උසස් අධ්‍යාපනික පාඨමාලාවන් හැදෑරීම සඳහා ලිචෙන්ස මේඩියා(හෝ වෘතීය පුහුණු) අධ්‍යාපනික සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**අංක 07 වන ආකාරය: අකඩේමියා දි බෙල්ලේ ආර්ති**, **ඩන්සා**, **ආර්තේ ඩ්‍රාම්මාතිකා**, **ඉසියා යනුවෙන්ය**, **කොන්සෙර්වාතෝරියෝ(පැරණි** ක්රමයට **(Accademia di Belle Arti, Danza, Arte Drammatica,**

ISIA, ecc., Conservatorio (vecchio ordinamento)) යනු ආර්තිස්තික්, සංගිතය සහ කොරේඋටිකා (A.F.A.M.) උසස් අධ්‍යාපනය ලබා තිබ්මය.

- එය අකඩෙමියා දි බෙල්ලේ ආර්ති, අකඩෙමියා නත්සියෝනාලේ දි ආර්තේ ඩ්‍රාම්මාතිකා, අකඩෙමියා නත්සියෝනාලේ දි ආර්තේ දි ඩන්සා, කොන්සෙර්වාතෝරියෝ දි මියුසිකා(සංගීතය) ඉස්තිතුතෝ සුපෙරියෝරේ පර් ලේ ඉන්ස්ත්‍රියේ අර්තිස්තිකේ(ISIA)(Accademie di Belle Arti, Accademia Nazionale di Arte Drammatica, Accademia Nazionale di Danza, Conservatori di Musica, Istituto Superiore per le Industrie Artistiche (ISIA) ) පැරණි නිර්දේශය යටතේ (ඔර්ඩිනමෙන්තෝ) පාඨමාලාවක්ද A.F.A.M. (නිති අංක 508/99).යන අංශයේ <u>මිට අවසන් වරට සිදු කරන ලද සංශෝධනට</u> ප්‍රථම පාඨමාලාවක් අවසන් කර තිබිය යුතුය.

යම් කෙනෙකු සෙකොන්දා සුපෙරියෝරේ ඩිප්ලෝමාවක්වත් ලබා <u>නොමැති</u> නම් මෙහි 05 වන ආකාරයෙහි සඳහන් අංකයට කතිරය ගසන්න.
යම් කෙනෙකු මෙම පාඨමාලාවක් හැදෑරිමට ප්‍රථම එය සම්පුර්ණ කිරිම සඳහා පොස්ට් ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇත්නම් අංක 09 කොටුවට කතිරයක් ගසන්න.

- භාෂා පරිවර්තක සහ භාෂා පරිවර්තනය සඳහා ඇති අධ්‍යාපන ආයතනයකින් ලද ඩිප්ලෝමාවක් අංක 697/86 යන <u>නිතියට ප්‍රථම</u> ලබා තිබ්ම(මෙහි 10 වන ආකාරයෙහි සඳහන් පරිදි)

අංක 08 වන ආකාරය: විශ්ව විද්යාලිය පාඨමාලාවක් (2-3) පැරණි හෝ නව නිර්දේශය යටතේ (මෙය විශේෂ පාසැල් හෝ විශ්ව විද්‍යාලය හා සමාන යනුවෙන්ය) විශ්ව විද්‍යාලිය ඩිප්ලෝමාවක් සඳහා සහ විශේෂ පාසැල් අධ්‍යාපනයක් වෙනුවෙන් නිකුත් කරන ලද ඩිප්ලෝමාවක් විය යුතුය.වසර 2 කට නොඅඩුව හෝ වසර 3 කට නොවැඩි කාලයක පාඨමාලාවක් අවසන් කර තිබ්ම(මෙය සංගණන ඩිප්ලෝමාවක්විම(diploma di statistica), එලෙමෙන්තාරි පාසැල් බලා ගැනිම(vigilanza alle scuole elementari), පැරණි නිර්දේශය යටතේ ලබා ගත් ISEF ඩිප්ලෝමාවක් , ඩිප්ලෝමා දි පලෙඔග්‍රැෆිය(diploma di paleografia ) සහ ෆිලොලොජිය මූසිකාලෙ(filologia musicale) ඩිප්ලෝමාවක් යනාදිය) විශ්ව විද්‍යාලිය ඩිප්ලෝමාව ජාත්‍යායන්තර වශයෙන් ගත හොත් එය සමාන වන්නේ පළමු වන වසරේ විශ්ව විද්‍යාලිය අධ්‍යාපනයේ පළවන අදියරයටය.(උදාහරණයක් වශයෙන්ගත් කල බිඒ ඩිග්රිය, පළවන ඩිග්රිය – ඉංග්‍රිසි) මෙම පාඨමාලාවන් හැදෑරිම සඳහා ස්ක්වාලා සෙකොන්දාරියා සුපෙරියෝරේ ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය.(මෙම පාඨමාලාවක් සඳහා වසර 4-5 කාලයක් ගතවේ.)

අංක 09 වන ආකාරය: අකඩෙමියා දි අල්තා ෆ්ඔර්මත්සියෝනේ අර්තිස්තිකා, සංගීතය(මුසිකාලේ) සහ කොරෙඅවුටිකා (A.F.A.M.) ඩිප්ලෝමාවෙහි පළවන අදියර යනු A.F.A.M. (නිති අංක 508/99).යන අංශයේ සංශෝධනයට ප්‍රථම පාඨමාලාවක් අවසන් කර තිබිය යුතු විමය. මිට ස්ක්වාලා සෙකොන්දාරියා සුපෙරියෝරේ ඩිප්ලෝමාවක් ලබා තිබ්ම සහ එය අකඩෙමියා දි බෙල්ලේ ආර්ති(Accademie di Belle Arti), අකඩෙමියා නත්සියෝනාලේ දි ආර්තේ ඩ්‍රාම්මාතිකා(Accademia Nazionale di Arte Drammatica), අකඩෙමියා නත්සියෝනාලේ දි ආර්තේ දි ඩන්සා(Accademia Nazionale di Danza), කොන්සෙර්වාතෝරියෝ දි මියුසිකා(Conservatori di Musica) ඉස්තිතුතෝ සුපෙරියෝරේ පෙර් ලා ඉන්දුස්ත්‍රිය අර්තිස්තිකේ(ISIA) නව නිර්දේශය යටතේ පාඨමාලාවක්ද අවසන් කර තිබිය යුතුය.
වසර තුනක කාලයක් හදාරණ ලද පාඨමාලාවක් අවසන් කර ලබා ගත් ඩිප්ලෝමාවක් තිබිය යුතුය.

අංක 10 වන ආකාරය: නව නිර්දේශයට අයත් වසර තුනක උපාධිය ( I වන අදියර)
ඉස්තුරුත්සියෝනේ සුපෙරියෝරේ පාඨමාලාව සංශෝධනය යටතේ මෙය කොටස් දෙකකට වෙන් කර හැක.එය උපාදිය සහ විශේෂ උපාදිය /මජිස්ත්‍රාලේ යනුවෙනි. 1 වන අදියරේ වසර තුනක උපාදිය සඳහා වසර 3 කාලයක් අවශ්‍යය වන අතර මෙය සඳහා මේදියාතෝරි ලිංගුවිස්ට්චි සඳහා ඇති ස්කුවාලා සුපරියෝරේ අධ්‍යාපන ආයතනයකින් ලද ඩිප්ලෝමාවක් අංක 697/86 යන නිතිය සංශෝධනයෙන් පසුව ලබා තිබිය යුතුය.

අංක 11 වන ආකාරය: අකඩෙමියා දි අල්තා ෆ්ඔර්මත්සියෝනේ අර්තිස්තිකා, සංගීතය(මුසිකාලේ) සහ නර්ථන (කොරෙඅවුටිකා) (A.F.A.M.) ඩිප්ලෝමාවෙහි දෙවන අදියර යනු A.F.A.M. (නිති අංක 508/99).යන අංශයේ සංශෝධනයට පසුව හැදෑරූ පාඨමාලාවක් අවසන් කර තිබිය යුතු විමය. මේ සඳහා පළවන අදියරේ ඩිප්ලෝමාවක් හෝ වසර තුනක උපාධියක් සහ එය අකඩෙමියා දි බෙල්ලේ ආර්ති(Accademie di Belle Arti), අකඩෙමියා නත්සියෝනාලේ දි ආර්තේ ඩ්‍රාම්මාතිකා(Accademia Nazionale di Arte Drammatica), අකඩෙමියා නත්සියෝනාලේ දි ආර්තේ දි ඩන්සා(Accademia Nazionale di Danza), කොන්සෙර්වාතෝරියෝ දි මියුසිකා(Conservatori di Musica) ඉස්තිතුතෝ සුපෙරියෝරේ පෙර් ලා ඉන්දුස්ත්‍රිය අර්තිස්තිකේ (ISIA) නව නිර්දේශයේ පාඨමාලාවක්ද අවසන් කර තිබිය යුතුය.
වසර දෙකක කාලයක් හදාරණ ලද පාඨමාලාවක් අවසන් කර ලබා ගත් ඩිප්ලෝමාවක් තිබිය යුතුය.

අංක 12 වන ආකාරය: පැරණි නිර්දේශය යටතේ ලද උපාදිය(වසර 4-6 අතර) හෝ නව නිර්දේශය යටතේ විශේෂ උපාදිය හෝ නව නිර්දේශය යටතේ ලද මජිස්ත්‍රාලේ පාඨමාලාවක්, විශේෂ දෙවසරක උපාදිය (II වනඅදියර)ක් යනු

- <u>විශ්ව විද්‍යාලිය උපාදිය පැරණි නිර්දේශය යටතේ</u> යනු විශ්ව විද්‍යාලිය ඩිප්ලෝමාවක් වසර 4 කට නොඅඩුව හෝ වසර 6 කට නොවැඩි කාලයක පාඨමාලාවක් අවසන් කර තිබ්මය. මෙම පාඨමාලාවක් හැදෑරිම සඳහා ස්ක්වාලා සෙකොන්දාරියා සුපෙරියෝරේ ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය.(වසර 4-5 අතර)මෙම උපාදිය ජාත්‍යාන්තර වශයෙන් ගත හොත් එය සමාන වන්නේ පළමු වන වසරේ විශ්ව විද්‍යාලිය අධ්‍යාපනයේ දෙවන අදියරටය (උදාහරණයක් වශයෙන් ගත් කල ප්‍රංශ භාෂාවේ මයිට්රිස්ය)
- <u>සුවිශේෂ හෝ මජිස්ත්‍රාලේඋපාදිය වන්නේ</u> ඖෂධවේදී, දන්ත වෛද්‍ය, පසු වෛද්‍ය සහ ගොඩනැගිලි ඉංජිනේරු(වසර 5 ක කාලයක්), වෛද්‍ය (වසර 6 ක කාලයක්) සහ නීතිවේදී උපාදිය(2007/08 වසරේ සිට ක්‍රියාත්මකවේ) යනුවෙන්ය. මෙම උපාදිය සඳහා වසර 3 කට පසුව යම්කිසි සුදුසු කමක් නොලබන අතර සම්පුර්ණ කාලය අවසන් කිරිමෙන් පසුව උපාදිය ලබා ගත හැක.

ප්‍රශ්න අංක 5.2 සහ 5.3

යම් පුද්ගලයකු පෞද්ගලික අධ්‍යාපන ආයතනකින් හෝ රැකියාවක් සඳහා පුහුණු කරන විශේෂ අධ්‍යාපන ආයතනයක් මගින් බාහිර මාස්ටර් උපාධියක් ලබා ගෙන ඇත්නම් ඔවුන් ප්‍රශ්න අංක 5.2 හි අංක 2 ට (“නැත”) පිලිතුරු දිය යුතුය. ප්‍රශ්න අංක 5.3 ට එක පිලිතුරකට වැඩිය දිය හැක

I වන අදියරේ මාස්ටර් එකක් යනු උපාධියක් ලබා ගෙන වසර තුනක කාලයකට පසුව 1 වන අදියරේ උපාධියක් හෝ A.F.A.M. 1 වන අදියරේ ඩිප්ලොමාවක් ලබා ගෙන ගත හැකි උපාධියක් වන අතර එහි කාල සිමාව අවුරුද්දක් වනවා ඇත.

II වන අදියරේ මාස්ටර් එකක් යනු විශේෂ/මැජිස්ත්‍රාලේ උපාධියක් හෝ A.F.A.M. II වන අදියරේ ඩිප්ලොමාවක් ලබා ගෙන ගත හැකි උපාධියක් වන අතර එහි කාල සිමාව අවුරුද්දක් වනවා ඇත.

විශේෂ අධ්‍යාපන ආයතනයක පරණ නිර්දේශය යටතට පසුව ලබා ගත් උපාධියක් වනවා ඇත. මෙය පැරණි නිර්දේශය ගැනද නව නිර්දේශයෙහි සුවිශේෂ හෝ මජිස්ත්‍රාලේ උපාධියක්ද නව නිර්දේශය ගැන සුවිශේෂවු උපාධියක්ද වසර 2 කට නොඅඩු කාලයක විශේෂ රැකියා සඳහා පුහුණු කරන පාඨමාලාවක්ද වනවා ඇත.

මෙහි (ස්ක්වාලා දි ස්පෙෂලිත්සත්සියෝනේ)“විශේෂ උපාධියක්” සඳහා ඩිප්ලෝමාවක් ලබා ඇති පුද්ගලයන්ද (දෙවන විශේෂ උපාධියක් සඳහා ඩිප්ලෝමාවක් ලබා ඇති) අවම වශයෙන් උපාධියක් ලබා ගෙන වසර 4 කට නොඅඩු කාලයක පාඨමාලාවක්ද හදාරා ඇති පුද්ගලයන්ද අංක 3 කොටුවට කතිරයක් ගසන්න.(උදා. අභ්‍යාවකාශ[ස්පත්සියාලේ] ඉන්ජිනේරුවන්)

පර්යේෂණ ඩොක්ටරේට් එකක්(පර්යේෂණ කටයුතු සඳහා ඩොක්ටරේට් එකක්) මෙය උපාධියක් ලබා ගැනිමෙන් පසුවද (පැරණි නිර්දේශය ගැන උපාධියක්ද නව නිර්දේශය ගැන සුවිශේෂවු උපාධියක් හෝ මජිස්ත්‍රාලේ උපාධියක්ද වසර 2 කට නොඅඩු කාලයක නව නිර්දේශය ගැන II අදියරේ උපාධියක්ද යනුවෙනි) වසර 3 කට නොඅඩු කාලයක විශේෂ සොයා බැලිම් කරන විද්‍යාව පිලිබඳව සහ රට ආදාල අංශයේ පෞද්ගලික විස්තර ඇතුලු පර්යේෂණයන් ගැන පාඨමාලාවක්ද හදාරා ලද උපාධියක් වනවා ඇත. ජාත්‍යානතර වශයෙන් ගත් කල පර්යේෂණ ඩොක්ටරේට් එකක් යනු බාහිර උපාධියක් ලබා ගෙන විශ්ව විද්‍යාලිය අධ්‍යාපනය අවසන් කර දෙවන අදියරයේදි උපාධියක් වනවා ඇත. (උදා පිඑච්.ඩි)

## 6 වෘතිමය සහ වෘතිමය නොවනතත්වයන්

**ප්‍රශ්න අංක 6.1**

*මෙහි රැකියාවක් යනුවෙන් සඳහන් වන්නේ පඩියක්, ආදායමක් වශයෙන් ලාබයක් ලබා ගත හැකි ඕනෑම වර්ගයේ වැඩක්ය. මෙය ගෘහණියක් විසින් එදි නෙදා පැය ගණනක් සිදු කරන වැඩ නොවන අතර, කුඩා ලෙස සිදු කරන නඩත්තු සහ ගෙදරදර වැඩකටයුතු, විනෝදය පිණිස සිදු කරන ක්‍රියාවන් යනාදිය නොවනවා ඇත.*

**මෙහි 1 වන කොටුවට (“ඔව්”) කතිරය ගැසිය යුතු වන්නේ:**

- ඔක්තොම්බර් මස 2 වන සහ 8 වන සතිය අතර කාලය තුල වැටුපක් සහ නිත්‍යානුකුල කොන්ත්‍රාත්තුවක් සහිත යම් සේවාදායකු ලග පැයක් හෝ පැයකට වැඩි ප්‍රමාණයක් වැඩ කරන ලද හෝ තමන් විසින් හෝ සෑමදාම කරන, ඉදහිට කරන හෝ සෘතුමය වශයෙන් කරන රැකියාවක නියැලි සිටි පුද්ගලයින් පමණි. මේය ඕනැම ආදායමක් ලබන වැටුපක් විය හැකි අතර ලබන පඩිය, ලබන ලාභයන්, ස්වභාවයෙන් උපයා ගත් මුදල්, කෑම බිම දිමෙන් ලද හෝ නිවාස කුලියට දිමෙන් ලබන මුදල්ද අනිකුත් ලබන ආදායම්ද තවමත් ලබා නොගත් ආදායම්ද තමා විසින් සේවය සපයා ඉන් සති කිහිපයකට පසුව ලද ආදායම්ද ඇති පුද්ගලයන් අංක 1 දරණ කොටුවට කතිරය ගසන්න. තවද තිරෝචින්යෝ සහ ස්ටාජ් කරන පුද්ගලයන්ද වැටුපක් ලබන හෝ වැඩ දිගටම කරනවා නමුත් <u>මුදලින් නොවන ආදායමක් ලබන්නන්ද</u>.(කෑම කුපන්,ජංගම දුරකථන ලෝඩ කිරිම,පෙට්රල් කුපන් යනාදිය) අංක 1 දරණ කොටුට කතිරය ගැසිය යුතුය.
- ඔක්තොම්බර් මස 2 වන සහ 8 වන සතිය අතර කාලය තුල පැයක් හෝ පැයකට වැඩි ප්‍රමාණයක් වැඩ කරන ලද, තමන්ගේ ඥාතියෙකුට උදව් කරමින්ද තමන්ගේ ඥාතියෙකුට අයත් වැඩ පොළක උදව් කරමින්ද අදාල ආයතනයකට හෝ කොම්පැණියකට පඩියක් නොමැතිව වැඩ කරන පුද්ගලයින් පමණි.(කොඅවුදියෝවන්ති ෆැමිලියාරේ)

කොඅවුදියෝවන්ති ෆැමිලියාරේ යනු තම පවුලේ රැකියාවක් පවත්වා ගෙන යන අයෙකුට උදව් කරන ඥාතියෙකුට වන අතර නිත්‍යානුකුල කොන්ත්‍රාත්තුවක් නොමැතිව උදව් කරයි(උදා: කඩ සාප්පුවක ස්වාමි පුරුෂයාට උදව් කරන භාර්යාව, කෂිකර්මාන්තයෙහි යෙදෙන පියෙකුට උදව් කරන පුතෙකු යනුවෙන්ය)

**මෙහි අංක 2 කොටුවට (“නැත”) කතිරයක් ගැසිය යුතු වන්නේ:**

- ඔක්තොම්බර් මස 2 වන සහ 8 වන සතිය අතර කාලය තුල අදාල ආයතනයන්ට, සංවිධාන වලට, සංස්ථාවලට, සමාගම් වලට ස්වෙච්චා සේවය හෝ ඒ හා සමාන නොමිලේ සෙවයක් ලබා දුන් පුද්ගලයන්ය;
- සෘතුමය රැකියාවක නියැලි සිටින පුද්ගලයන් ඉහත සඳහන් කාලයේදි රැකියාවක නිරතව නොසිටියේ නම් එම පුද්ගලයන්ය.

**ප්‍රශ්න අංක 6.2**

**මෙහි 1 වන කොටුවට (“ඔව්”) කතිරය ගැසිය යුතු වන්නේ:** ඔක්තොම්බර් මස 2 වන සහ 8 වන සතිය අතර කාලය තුල පහත සඳහන් හේතු මත රැකියාවට නොගොස් සිටි පුද්ගලයන්ය. රට හේතු ලෙස සලකන්නේ නිවාඩු(ferie) සඳහාත්,දෙපාර්ශවයේ එකඟතාවය මත කිසියම් කාලයක් රැකියාව නොකර සිටීම(aspettativa), මාතෘත්වය/පිතෘත්වය නිසාත්(maternità/paternità),රැකියා ස්ථානයේ වැඩ අඩුවිම නිසාත්(ridotta attività dell’impresa), රෝගාතුරුවිම නිසාත්(malattia), නිවාඩු යෑම නිසා(vacanza) CIG (කස්සා ඉන්ටග්‍රත්සියෝනේ සඳහා ලබන ආදායම) යනාදිය. මෙම ප්‍රශ්නයට පිලිතුරු දිමෙන් තම රැකියාවේ ස්ථාවරත්වය සහ

**එයට ඔබ කොපමණ කැමතිද යන වගද ඔබ කොපමණ නිවාඩු ගන්නවාද සහ ඔබ ලබන ආදායම ගැන විස්තර දැන ගත හැක.**
සේවකයින් සේවයට වාර්ථා නොකලේය යන්නෙන් අදහස් කරණුයේ, මාස තුනකට අඩුකාලයක් සේවයට නොපැමිණි බව වන අතර, එමෙන්ම සේවයට නොපැමිණි එම කාලය තුල අවම වශයෙන් වැටුපෙන් **50%**ක් ලැබුනු බවයි. මෙහිදී මාතෘත්වය(අනිවාර්ය නොපැමිණීමක්) හෝ දෙමාපියෙකුගේ මරණය හේතුවෙන්(නොපැමිණීම අනිවාර්ය නොවේ) සේවකයින්ගේ නොපැමිණීමේ හේතූන් ගනන් නොගැනේ. **පවුලේ හේතු මත රැකියාවකට නොයන සේවකයන් රැකියාවට උනන්දුවක් දක්වනවා නම් ඔවුන්ද රැකියාවක නියැලි ඇති වග සටහන් කල යුතුය. මාස තුනකට වඩා පවුලේ හේතු මත රැකියාවකට නොයන සේවකයන්ද රැකියාවක නියැලි ඇති වග සටහන් කල යුතුය.**

**ප්‍රශ්න අංක 6.3**
**යම් පුද්ගලයෙකු මෙම අවසන් සති 4 ඇතුලත (සැප්තැම්බර් මස 11 වන දින සිට ඔක්තෝම්බර් මස 8 වනදා දක්වා කාලය තුල)** රැකියාවක් සඳහා **පත්තර වල ඇති දැන්වීම් වලට පිලිතුරු දුන්නේ නම්ද යම්** තරඟකාරී රැකියා රැකියාවක් සඳහා පෙනී සිටියේ නම් හෝ **තම *ජීවදත්ත* විස්තර සදහන් කර යම් ආයතනයකට යවා ඇත්නම් නම් මෙහි අංක 1 කොටුවට කතිරයක් ගසන්න.** ("ඔව්")
සංසණනය පවත්වන දින(**2011** ඔක්තෝබර් **9**) සිට මාස 3 ඇතුලත රැකියාවක් කිරීමට අපේක්ෂා කරණ කව්රුන් වුවද "ඔව්" යනුවෙන් සඳහන් කරන්න.

**ප්‍රශ්න අංක 6.5**
**මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුත්තේ ප්‍රශ්න අංක 6.3 සහ අංක 6.4 හි අංක 1 දරණ කොටුවට** ("ඔව්") **කතිර ගැසු පුද්ගලයන් පමණි. අනිකුත් පුද්ගලයන් මෙම ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න අංක 6.6** සිට පිළිතුරු සපයන්න.
**දැනට රැකියාවක් නොකරන පුද්ගලයන්ද, තවම රැකියාවක් සොයන පුද්ගලයන්ද මින් පුථම වැටුපක් ලබා ගෙන රැකියාවක නියැලි සිටින පුද්ගලයන්ද** වැටුපක් **රහිත රැකියාවක නිරතව සිටින පුද්ගලයන්ද මෙහි අංක 1 කොටුවට** ("ඔව්") **කතිරයක් ගසන්න.** වැටුපක් නොලබා රැකියාවක් කරණවා යන්නේ අදහස් කරණුයේ coadiuvante familiare නැතහොත් තම පවුලේ මැදිහත්වීමෙන් පවත්වාගෙන යන කිසියම් රැකියාවකට දායකත්වය සැපයූ බවයි.

**ප්‍රශ්න අංක 6.6**
***මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිමේදි පහත සදහන් කරුණු අනුගමනය කරන්න:***
ආදායම් උපයන්නා හෝ උපයන්නිය පෙර කල රැකියාවක් නිසා එක් හෝ වැඩි විශ්‍රාමික වැටුප් ලබන්නෙක් හෝ ආදායම් උපයන්නා හෝ උපයන්නිය තම දේපල මගින් ආදායම් ලබන්නෙක්

- **<u>කුඩා හෝටලයක හෝ විවිධ හෝටල් වල උපදේශකයා හෝ උපදේශිකාවන් මින් පෙර කරන ලද රැකියාව යනු</u>: යම් කෙනෙකු මහලු වයසට ගොස් හෝ නිසි වයස සම්පූර්ණවුවායින් පසු හෝ ආබාධිතයෙකු ලෙස විශ්‍රාම වැටුපක් ලබා ගැනිමය. මහලු වයසට ගොස් හෝ නිසි වයස සම්පූර්ණවුවායින් පසු හෝ ආබාධිතයෙකු ලෙස විශ්‍රාම වැටුපක් ලබයි නම් එය දෙනු ලබන්නේ එම පුද්ගලයා විසින් සිදු කරන ලද රැකියාවට අනුවත් දත්ත විස්තර සදහන් නගර සභාවේ ලියා පදිංචි නිසි වයස සම්පූර්ණවු පසුවය. තවද මෙම අංශයට වැඩ කල නොහැකි අයද අයත් වනවා ඇත. රැකියා ස්ථානයන්හි තුවාලවීමෙන් ලැබෙන ඉන්දෙන්නිත්සියාරේ හෝ විශේෂ ලෙස රෝගාතුරුව සිටීම. මෙම විශ්‍රාම වැටුප අවම වශයෙන් ගෙවනු ලබන්නේ අදාල පුද්ගලයා රෝගය ගැන සලකා බැලීමෙන් හෝ මරණය සිදුවී තිබුනොත් පමණි.(මෙම අවස්ථාවේදි ජීවත්ව සිටින පුද්ගලයන්ට එය ලබා ගත හැක.)යම් අවස්ථාවකදි තමා රැකියා කරන ස්ථානයේ මෙය සිදුවුයේ නම් අදාල විශ්‍රාම වැටුප ගෙවනු ලබන්නේ කොන්ත්‍රිබියුති අවම කාලයකට ගෙවා තිබුනොත් පමණි.**
- <u>ආදායම් උපයන්නා හෝ උපයන්නිය රැකියාවක්</u> නිසා එක් හෝ වැඩි විශ්‍රාමික වැටුප් ලබන්නෙක් හෝ ආදායම් උපයන්නා හෝ උපයන්නිය තම දේපල මගින් ආදායම් ලබන්නෙක් බව.

**පාසැල් යන ළමයින්**: අධ්‍යාපනය ලබන අය පමණය.
**ගෘහණිය**: මින් අදහස් කරනුයේ තම පවුල සහ නිවස ගැන සොයා බලන්නා යනුවෙන්ය.
**වෙනත් අවස්ථාවන්ය**: **මෙහි අදහස යනු ඉහත සදහන් නොකල දේවල්ය. (උදා හරණයක් වශයෙන් ගත් කල මහලු වයසට ගොස් හෝ නිසි වයස ඉක්මවීමෙන්** උදාහරණයක් ලෙස විවිධ වූ ක්‍රියාකාරීත්වයෙන් යුත් වෘත්තීන් හී නියැලීම නිසා විශ්‍රාමික වැටුපක් ලබන්නන්, විශ්‍රාමිකයෙක්, ආබාධිත තත්වය මත විශ්‍රාම වැටුපක් ලබන්නන් වැනි...)

## 7 අධ්‍යාපන සහ සේවා ස්ථානය

**ප්‍රශ්න අංක 7.1**

– **අසිලෝ නිඩෝ යන හෝ ස්ක්වාලා දි ඉන්ෆන්සියා යන ළදරුවන්ද මෙහි අංක 1 කොටුවට** (“ඔව්, **මම ඉගෙන ගන්නා ස්ථානයට)කතිරයක් ගසන්න.**

– **රැකියා කරමින් ඉගෙන ගන්නා ළමයින්ද මෙහි අංක 2 කොටුවට** (“ඔව්, **මම රැකියා ස්ථානයට යමි)කතිරයක් ගසන්න.**

– **විවධ කෘෂිකාර්මික වතු වල වතු වැඩ කරන පුද්ගලයන් සහ ස්ථර රැකියා ස්ථානයන් නොමැතිව වැඩ කරන පුද්ගලයන් මෙහි අංක 5 කොටුවට** (“නැත, **මට ස්ථර රැකියා ස්ථානයක් නැත)කතිරයක් ගසන්න.**

– **මෙහි අංක 6 කොටුවට කතිරයක් ගැසිය යුත්තේ(**“නැත මන්ද අධ්‍යාපනය නොලබමි, රැකියාව නොකරමි සහ වෘතීය පුහුණු පාඨමාලා නොකරමි.“**)පාසැලට දිනපතා දරුවන් රැගෙන යන නිසා රැකියා ස්ථානයකට හෝ ඉගෙනිමට නොයන පුද්ගලයන්ය.**

**ප්‍රශ්න අංක 7.2**

– **ඔබගේ රැකියා මුලස්ථානය සහ රැකියාවට යන ස්ථානය(සෑම දිනකම රැකියාව කරන) අතර සමාන තාවයක් නැතිවිය හැක.එම නිසා උදාහරණයක් වශයෙන් ගත් කල ඔබ යකඩ කම්හලක අඨත්වැඩියා කිරිමේ කොන්ත්‍රාත් භාරකාර සමාගමේ සේවකයෙකු විය හැක.එවිට ඔහු එම රැකියාව කරන ස්ථානයේ** ලිපිණය **මිස එම වැඩ කරන සමාගමේ ලිපිනය නොදිය යුතුය.**

– **යම් අවස්ථාවක උදාහරණයක් වශයෙන් ගත් කල මෙම සංගණනය සිදු කරන අවස්ථාවේදි ඔබගේ කාර්යාලයක හෝ ඔබ සේවය කරන කාර්යාලය හැර වෙනත් කාර්යාල වල ඔබ උපදේශක සේවයෙහි යෙදෙනවා නම් ඔබ සේවය කරන ස්ථානයේ ලිපිනය දිය යුතුය.**

– **රැකියාවක නිරතව සිටින පාසැල් ළමයින් ඔවුන් සේවය කරන ස්ථානයේ ලිපිනය දිය යුතුය.**

– **රැකියාවක නිරතව සිටින ගමනා ගමන සේවයේ නියැලි සිටින පුද්ගලයන්(රියැදුරන්, දුම්රිය රියැදුරන්, ට්‍රැම් ධාවනය කරන රියැදුරන්, ගුවන්ගමන් ධාවනය කරන රියැදුරන්, නැව් ධාවනය කරන රියැදුරන් යනුවෙන්) තමන් රැකියාව ආරම්භ කරන ස්ථානයේ ලිපිනය දිය යුතුය.(වාහන නැවතුම්පොළ, දුම්රියපොළ, බස් නැවතුම්පොළ, ගුවන් තොටුපොළ, නැව් තොටුපොළ යනාදිය) යම් කෙනෙකු අධ්‍යාපනය ලබන හෝ රැකියාව කරන ස්ථාන දෙකක් ඇත්නම් ඉන් පළමුව යන ස්ථානයේ ලිපිනය දිය යුතුය.**

– **යම් අවස්ථාවක උදාහරණයක් වශයෙන් ගත් කල මෙම සංගණනය සිදු කරන අවස්ථාවේදි ඔබගේ කාර්යාලයක හෝ ඔබ සේවය කරන කාර්යාලය හැර වෙනත් කාර්යාල වල ඔබ උපදේශක සේවයෙහි යෙදෙනවා නම් ඔබ සේවය කරන ස්ථානයේ ලිපිනය දිය යුතුය.**

**ප්‍රශ්න අංක 7.3**

යම් පුද්ගලයෙකු රැකියාව කරණුයේ තමාගේ ස්ථිර පදිංචිය පිහිටි නගර සභාවේ හෝ වෙනත් ඉතාලියාණු නගර සභාවක නම් අධ්‍යාපනය ලබමින් පදිංචි ස්ථානය හෝ වෘතියේ නියැලෙන ස්ථානය විශේෂයෙන් සඳහන් කල යුතුය.

**ප්‍රශ්න අංක 7.4**

**මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිමේදි තමා දිනපතා අධ්‍යාපනය ලබන හෝ රැකියාව කරන ස්ථානයට යනවා නම්, එම පුද්ගලයා ප්‍රශ්න අංක 7.1 හි අංක 1 දරණ කොටුවට කතිරයක් ගැසිම** (“ඔව්, **මම සෑම දිනම අධ්‍යාපනය ලබන ස්ථානයට යමි) හෝ අංක 2 දරණ කොටුවට කතිරයක් ගැසිමෙන්(**“ඔව්, **මම සෑම දිනම මාගේ රැකියාව කරන ස්ථානයට යමි)යනුවෙන් පමණක් පිලිතුරු දිය යුතුය.**

**ප්‍රශ්න අංක 7.5**

**මෙම ප්‍රශ්නයට පිලිතුරු සැපයිමේදි තමා දිනපතා අධ්‍යාපනය ලබන හෝ රැකියාව කරන ස්ථානයට තමා නිතර නැවති සිටින නිවසේ සිට යනවා නම් එම පුද්ගලයා ප්‍රශ්න අංක 7.4 හි අංක 1 දරණ කොටුවට (“මෙම නිවසේ සිට”) කතිරයක් ගසා පිලිතුරු දිය යුතුය.**